# සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 දෙසැම්බර් මස 10 වන දින පෙ.ව.10.00 ට ප්‍රාදේශීය සභාවේ සභා ශාලාවේදී පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව.

<u>සහභාගී වූ : -</u>

| | | |
|---|---|---|
| 1. ගරු සභාපති | - | ජී. ජයන්ත රෝහණ මැතිතුමා |
| 2. ගරු උප සභාපති | - | එස්.ඩී.මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා |
| 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව මැතිතුමා |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා |
| 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.මේරි මාග්‍රට් මැතිතුමිය |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ආර්. ගයාන් දුමින්ද චන්ද්‍රසිරි මැතිතුමා |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ලියනගේ චන්දන කුමාර මැතිතුමා |
| 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ.ඩී.එස්. ජයන්ත රණවක මැතිතුමා |
| 9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ. මංජුල ධම්මික වීරරත්න මැතිතුමා |
| 10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා |
| 11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සමන්ත උදය කුමාර ගමගේමැතිතුමා |
| 12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී. සනී හෙක්ටර් පිරිස් මැතිතුමා |
| 13.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.නන්ද කුමාරසිංහ මැතිතුමා |
| 14.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා |
| 15.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා |
| 16.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.කේ. උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා |
| 17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා |
| 18.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ඩී. ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය |
| 19.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය |
| 20.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ. සුසන්ත මැතිතුමා |
| 21.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා |
| 22.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්. වරුණ දිලිප් කුමාර මැතිතුමා |
| 23.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා |
| 24.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා |
| 25.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා |
| 26.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා |
| 27.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා |
| 28.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්. අසෝක වැලිකල මැතිතුමා |
| 29.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පුස්සැල්ලගේ අමල් නිශාන්ත සිල්වා මැතිතුමා |
| 30.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා |
| 31.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී. කුමුදිණි ජයවර්ධන මැතිතුමිය |
| 32.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ශෂිණි ශ්‍රීමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය |
| 33.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ර්.ජී.ඩී. ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිතුමිය |
| 34.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය |
| 35.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා |
| 36.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්. චන්දන සූරියආරච්චි මැතිතුමා |
| 37.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සුනිල් රණසිංහ මැතිතුමා |
| 38.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය |
| 39.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.ඒ.ප්‍රදිප් කුමාර් මැතිතුමා |

<u>සහභාගි නොවූ</u>

| | | |
|---|---|---|
| 1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.පී. යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා |
| 2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩී. පිලිෂියා ඇනට් ඔල්ගා මැතිතුමිය |
| 3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී. කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා |
| 4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ.ඩී.සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය |

මහා සභා රැස්වීම සඳහා සහභාගි වීමට පැමිණි ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ප්‍රධාන කාර්යමණ්ඩලය, ජනමාධ්‍යවේදී මහත්වරුන් ඇතුළුව පැමිණ සිටි සියළුදෙනා ගෞරවයෙන් පිළි ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් 2018 දෙසැම්බර් මස මහා සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

න්‍යායපත්‍රානුකූලව පළමුවෙන්ම පසුගිය සභා රැස්වීම් වාර්තා සංශෝධන හා වෙනස්කම් ඇතොත් පෙන්වා දී එම වාර්තාවන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවෙන් ඉල්ලා සිටින ලදී.

**01.** <u>පසුගිය රැස්වීම් වාර්තා සම්මත කර ගැනීම.</u>

**I.** **2018.11.05** දින පැවති විශේෂ සභා රැස්වීමේ වාර්තාව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, **2018.11.05** වන දින පැවති විශේෂ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>**2018.11.05** වන දින පැවති විශේෂ සභා රැස්විමේ වාර්තාව පිළිගත යුතු සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>

**II.** **2018.11.12** දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, **2018.11.12** වන දින පැවති විශේෂ සභා රැස්වීමේ චන්දන ලියනගේ ගරු මන්ත්‍රීතුමාත්, ගමගේ චන්ද්‍රසිරි ගරු මන්ත්‍රීතුමාත් ඒවගේම උපුල් මනෝජ් රූපසිංහ ගරු මන්ත්‍රීතුමාගේත් කථාවන් ටික සභා වාර්තාවේ නැහැ. මේ තුන්දෙනා සභාව වේලාවේදී කථා කළා. විරෝධතාවයක් ප්‍රකාශ කළා. ඒ විරෝධතාවය සටහන් විය යුතුයි ගරු සභාපතිතුමනි. මොකද එතුමන්ලා **2018.11.16** දින පැවති විශේෂ සභාවේදී කියනවා අපි ඒකට විරුද්ධ වුණේ මුදල් ලැබෙනවාද නැද්ද කියන එක ගැන විශ්වාසයක් නැති නිසා කියලා. ඊට පස්සේ අපි කාරක සභාවක් බවට දෙපාරක් පත් කළා. ඒ නිසා සභා වේලාවේදී කථා කරපු සියළු දේ සවිස්තරාත්මකව ඒ කථා තුන වාර්තාවට ඇතුළත් විය යුතුයි.

<u>ගරු සභාපතිතුමා</u>

කාරක සභාවක් බවට යෝජනා කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මෙම මහා සභාව කාරක සභාවක් බවට පත් කළ යුතු යැයි යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු සභාපතිතුමා</u>

**2018.11.12** දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කරන්න. දැන් සංශෝධන මොනවාත් නැහැනේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, **2018.11.12** වන දින මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>**2018.11.12** වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව පිළිගත යුතු සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>

**III. 2018.11.16** දින පැවති විශේෂ සභා රැස්වීමේ වාර්තාව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, **2018.11.16** වන දින පැවති විශේෂ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>**2018.11.16** වන දින පැවති විශේෂ සභා රැස්වීමේ වාර්තාව පිළිගත යුතු සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>

## <u>02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.</u>

**01.2018.05.11** දින මහා සභාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ යටතේ නිමල් යසසිරි කළුපහන මැතිතුමා විසින් "ගංවතුර පාලන ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර දෙන ලෙසට" ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යොමු කල ලිපියට පිළිතුරු වශයෙන්, ඉහත ඉල්ලීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර මේ සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කරන ලෙස දන්වමින් වාර්මාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික සහකාර විසින් අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත **2018.10.19** දිනැතිව යොමු කල ලිපියේ පිටපත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, සංදේශ පෙත්සම් ඉදිරිපත් කරන්න කලින් මට කියන්න තියෙන්නේ මේ සභාවට අපි වෙත ලැබුණු සංදේශ පෙත්සම් ඉදිරිපත් කරලා තියෙනවා. ඒවා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව යම් කරුණු පැහැදිලිකිරීමක් කර ගැනීමට අවශ්‍ය නිසා මෙම මහා සභාව කාරක සභාවක් ලෙසට පත් කළ යුතු යැයි යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනිල් රණසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනිල් රණසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.

03- (01) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමනී ස්වර්ණලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලදී.

01.දිද්දෙණිය ප්‍රදේශයේ අක්කර 06 නමැති ඉඩමේ පවත්වාගෙන යනු ලබන ගල් වල ස්ථිරවම නවතා දෙන ලෙස ඉල්ලමින් හංවැල්ල, දිද්දෙණිය උතුර, නො.158 හි පදිංචි හංසිකා සෙව්වන්දි දියණිය විසින් තවත් එම ප්‍රදේශයේ දරුවන් 17 දෙනෙකුගේ ද අත්සන් සහිතව සභාපති, සීතාවක ප්‍රාදේශීය සභාව වෙතද පිටපතක් සහිතව අතිගරු ජනාධිපතිතුමා අමතා 2018.12.05 දිනැතිව යොමු කරන ලද ලිපිය.

02.අංක 440 නෙළුවත්තුඩුව ග්‍රාම නිලධාරි වසමේ ගල් කැටි කන්ද නම් ඉඩමට මායිම්ව දුම්මලේ කන්ද නම් ඉඩමේ කළු ගල් කොරියක් ආරම්භ කිරීමට සූදානම් වන බව දන්වමින් වග, නෙළුවත්තුඩුව, නො.200/2 හි පදිංචි ඩබ්.ඩී. චන්ද්‍රිකා සමන්මලී මහත්මිය විසින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක් ද සමගින් සභාපති, සීතාවක ප්‍රාදේශීය සභාව වෙතද පිටපතක් සහිතව අතිගරු ජනාධිපතිතුමා අමතා 2018.12.06 දිනැතිව යොමු කරන ලද ලිපිය.

03.අංක 439/ඒ දිද්දෙණිය දකුණ ග්‍රාම නිලධාරි වසමේ අක්කර 06 නැමැති ඉඩමේ F S A හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම විසින් පවත්වාගෙන යනු ලබන කළුගල් කොරිය නිසා වන පීඩාවන් සම්බන්ධයෙන් දිද්දෙණිය, හංවැල්ල හි සුරකිමු අපේ ගම පරිසර සංවිධානය විසින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමගින් සභාපති, සීතාවක ප්‍රාදේශීය සභාව වෙතද පිටපතක් සහිතව අතිගරු ජනාධිපතිතුමා අමතා 2018.12.07 දින යොමු කරන ලද ලිපිය.

03- (02) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ප්‍රසන්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

01.වග ඉරිදාපොළ පිහිටි ගැමුණු මාවත සීතාවක ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධන කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා තුම්මෝදර, ඉරිදාපොළ, වග නො. 263/4 හි පදිංචි ආර්.ජේ.එස්. ප්‍රේමකුමාර මහතා විසින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක් ද සමගින් 2018.11.25 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ප්‍රසන්න මැතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

02.වග හල්පේ වත්ත වතුයායේ කුණු කසල විධිමත්ව බැහැරලීමට අවශ්‍ය කටයුතු වතුයාය මගින් සංවිධානය කර ඇති බැවින් එම කුණු කසල සභාවේ ට්‍රැක්ටරය මගින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා පුස්සැල්ලාව වතු සමාගම හල්පේ Group වතු අධිකාරි විසින් 2018.12.07 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ප්‍රසන්න මැතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

03- (03) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

01.පාදුක්ක, අංගමුව අනවසර ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තය සම්බන්ධවයි යන හිසින් යුතුව පාදුක්ක, අංගමුව අංක 189 හි පදිංචි ජයන්ත සේනාරත්න මහතා විසින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමගින් 2018.10.30 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**03- (04) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.**

**01.** සෝමානන්ද මාවත මාර්ග කාණු කපා සකසා ගැනීම සම්බන්ධවයි යන හිසින් යුතුව පිටුම්පේ සෝමානන්ද මාවත, පිටුම්පේ දකුණ පදිංචි ප්‍රදේශවාසීන් විසින් අත්සන් ලේඛනයක් ද සමගින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**02.** පාදුක්ක, පිටුම්පේ ගලබඩවත්ත ග්‍රාම නිලධාරී උතුර වසමේ පිහිටි සභාවට අයත් පොදු ළිඳ ඉදිරිපස ජල සම්පාදන මණ්ඩලයට අයත් ගල් බැම්ම මේ වනවිට හානියට පත්ව ඇති බැවින් එම බැම්ම පිළිසකර කර ළිඳ පරිහරණයට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලමින් පිටුම්පේ ගලබඩවත්ත ප්‍රදේශවාසීන් විසින් අත්සන් ලේඛනයක්ද සමගින් 2018.12.09 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**03- (04) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඒ.කේ. ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.**

**01.** වේරගොල්ල කන්දේවිහාර පාර 04 වන පටුමග ( සෙල්වකුමාර් නිවාස පාමුලින් ඇති මාර්ගය) සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලමින් වේරගොල්ල බෝධිභාරකාර සමිතිය විසින් 2018.12.02 දිනැතිව ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමගින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**02.** වේරගොල්ල කන්දේවිහාර පාර 03 වන පටුමග සඳහා විදුලි පහනක් ලබා දෙන ලෙස ඉල්ලමින් පුවක්පිටිය, වේරගොල්ල, නො.119/7/ඒ/1 හි පදිංචි ආර්. රාසන් මහතා විසින් 2018.12.02 දිනැතිව ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමගින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**03.** සීතාවක 03 වන පටුමග ( අනුර කඩය අසලින් කන්ද උඩම පාර) සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලමින් වේරගොල්ල බෝධිභාරකාර සමිතිය විසින් 2018.12.02 දිනැතිව ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමගින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**04.** කන්දේ විහාර පාර කාණු පද්ධතිය සකස් කර දෙන ලෙස ඉල්ලමින් වේරගොල්ල බෝධිභාරකාර සමිතිය විසින් 2018.12.02 දිනැතිව ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමගින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**05.** වේරගොල්ල වත්ත පාර 02 වන පටුමග ( පහළ ලැයිමට යන පාර) සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලමින් වේරගොල්ල බෝධිභාරකාර සමිතිය විසින් 2018.12.02 දිනැතිව ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමගින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**06.** වේරගොල්ල උළු මඩම පාරේ කාණු පද්ධතිය සකසා දෙන ලෙස ඉල්ලමින් වේරගොල්ල බෝධිභාරකාර සමිතිය විසින් 2018.12.02 දිනැතිව ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමගින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**07.** වේරගොල්ල උතුරේ පිහිටා ඇති පිඹුරුපත් අංක 765 යටතේ වන කැබලි 20 කින් යුත් ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ගන්නා ලෙස ඉල්ලමින් 2018.12.09 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඒ.කේ. ගුණරත්න මැතිතුමා විසින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - ඉදිරිපත්ව නැත.**

ගරු සභාපතිතුමා

යථා පරිදි කල් දී ඇති යෝජනා සඳහා ගමන් කිරිමට ප්‍රථමයෙන් තේ විවේකය සඳහා විනාඩි 15 කට සභාව කල් තියෙනවා.

**පෙ.ව. 11.30 ට තේ විවේකය සඳහා මහා සභාවේ වැඩ කටයුතු අත්හිටුවන ලදී.**

**පෙ.ව. 11.45 ට නැවතත් මහා සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.**

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05 – (01) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

**2018.05.11 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 05 – (06) යටතේ මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මා වෙත ගෙවීම් කිරිමට පවරන ලද බලය අනුව මා විසින් කරන ලද පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ගෙවීම් ඊට අනුරූපිව ඇති ගෙවීම් ලබන්නා වෙත ඊට ඉදිරියෙන් දක්වා ඇති මුදල ගෙවීම අනුමත කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

| අනු අංක | වවුචර් අංකය හා දිනය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | 2419 - 2423<br>2018.11.08 | 2018 ඔක්තෝම්බර් මස ප්‍රධාන කාර්යාලයේ, පාදුක්ක උප කාර්යාලයේ, කොස්ගම උප කාර්යාලයේ, හංවැල්ල උප කාර්යාලයේ හා කහහේන උප කාර්යාලයේ මාර්ග, සෞඛ්‍ය, ආයුර්වේද, පුස්තකාල හා ව්‍යාපෘති අංශයන්හි සේවයේ නියුතු ආදේශක සේවකයින් 101 දෙනෙකු වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීම. | 2,325,589.61 |
| 02 | 2611 – 2615<br>2018.11.23 | 2018 නොවැම්බර් මස ප්‍රධාන කාර්යාලයේ, පාදුක්ක උප කාර්යාලයේ, කොස්ගම උප කාර්යාලයේ, හංවැල්ල උප කාර්යාලයේ හා කහහේන උප කාර්යාලයේ සේවයේ නියුතු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවකයින් 184 දෙනෙකු සඳහා වැටුප් ගෙවීම. | 6,374,182.78 |
| 03 | 2608<br>2018.11.21 | සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවසක් තනා ගැනීමට ද්‍රව්‍යමය ආධාර වශයෙන් ලබා දීමට 10' ඇස්බැස්ටස් ෂීට් සෙවිලි තහඩු 1282 ක් ලබා ගැනීම වෙනුවෙන් රයිනෝ රූෆින් ප්‍රඩක්ට්ස් ලිමිටඩ් ආයතනය වෙත ගෙවීම් කිරිම. | 2,631,612.68 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.**

**ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.**

**ගරු සභාපතිතුමා**

**මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ඉදිරිපත් කරනවාද. මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වු යෝජනාවක් විදිහට සලකනවා.**

**ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

**05 – (02) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

**සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශාල වශයෙන් දෛනිකව එකතු වන දිරන කසල කොම්පෝස්ට් පොහොර බවට පත් කිරිමේ අරමුණින් කොස්ගම ප්‍රදේශයේ පිහිටුවා ඇති "කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිමේ ව්‍යාපෘතියේ" ව්‍යාපෘති කාල සීමාව 2018.12.31 වන දින අවසන් වීමට නියමිත බැවින්, එම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව 2019.01.01 දින සිට 2019.06.30 දින දක්වා මාස 06 ක කාල සීමාවක් දක්වා දීර්ඝ කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා.**

**ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.**

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සදහන් ගරු මන්ත්‍රිවරුන් විසින් අදහස් දක්වන ලදී.

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංජුල වීරරත්න මැතිතුමා.

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සුසන්ත රූපසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමා

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා තවත් අදහස් ඉදිරිපත් කරනවාද. මෙම යෝජනාවත් ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සනී හෙක්ටර් පීරිස් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

05 – (03) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශිය සභාවේ හංවැල්ල නව වෙළඳ සංකීර්ණයේ එම්. ප්‍රේමචන්ද්‍ර පෙරේරා යන අය නමින් ඇති අංක 70 දරණ කඩ කාමරයේ අයිතිය හංවැල්ල, ජයවීරගොඩ පාර, අංක 3/57 හි පදිංචි වයි.එල්.ඒ. අතුල කුමාර යන අයට පැවරිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ. සුසන්ත මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ඉදිරිපත් කරනවාද. මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ. සුසන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

05 – (04) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

2019 වර්ෂය සඳහා සීතාවක ප්‍රාදේශීය සභා පරිපාලන ගොඩනැගිල්ල, හංවැල්ල මහජන පුස්තකාල ගොඩනැගිල්ල හා ඒ ආශ්‍රිත පරිශ්‍රයේ පවිත්‍රතා හා සනීපාරක්ෂක කටයුතු ඉටු කර ගැනීමේ සේවාව මල්වාන, ලාවුලු ගස් හන්දිය, ලක්දීල් ක්ලිනින් ඇන්ඩ් මේන්ටනන්ස් ආයතනය සමඟ මසකට රු. 68,050.00 ක මුදලට ගිවිසුම් ගත වී එම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ගීතාමනී ස්වර්ණලතා මැතිතුමිය.

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සදහන් ගරු මන්ත්‍රිවරුන් විසින් අදහස් දක්වන ලදී.

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පී.ඒ. ප්‍රදීප් කුමාර් මැතිතුමා.

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සුසන්ත රූපසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමා

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා තවත් අදහස් ඉදිරිපත් කරනවාද. මෙම යෝජනාවත් ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගිතාමනී ස්වර්ණලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

05 – (05) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් දේපල 2019 වර්ෂයට බදු ලබා දීම සඳහා 2018.10.18 දින පැවති ටෙන්ඩර් මණ්ඩල තීරණය අනුව පහත උප ලේඛනයේ පළමු තීරයේ සඳහන් දේපල එකී උප ලේඛනයේ දෙවන හා තෙවන තීරයන්හි සඳහන් ටෙන්ඩර්කරුගේ නම හා ටෙන්ඩර් මුදල අනුව ගිවිසුම් ගත වෙමින් එකී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත කී උප ලේඛනය

| පළමු තීරය | දෙවන තීරය | තෙවන තීරය |
|---|---|---|
| දේපල විස්තරය | ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | ටෙන්ඩර් මුදල රු. |
| 1.හංවැල්ල සතිපොළ | අගුළුගහගමගේ උපේක්ෂා රිවිෂාණි පෙරේරා<br>නො. 119/ඒ/1, පහළ කොස්ගම, කොස්ගම. | 2,707,200.00 |
| 2.කහහේන සතිපොළ | කොඩිකාර හේවාවසම්ගේ සුදත් ප්‍රියදර්ශන කුමාර<br>374/බී, කහහේන, වග. | 124,500.00 |
| 3.පාදුක්ක මාළු කඩ අංක 01 | ආරච්චිගේ ජයතිලක<br>නො.230/1. හොරගල බටහිර, පාදුක්ක. | 88,200.00 |
| 4.පාදුක්ක එළ හරක් මස් කඩය | මොහොමඩ් සියාම් මොහොමඩ් සීමාස්<br>නො.151/ඒ, මීපේ, පාදුක්ක. | 2,599,560.00 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ඉදිරිපත් කරනවාද. මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

05 – (06) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභා ක්‍රියාත්මක බලධාරිත්වය ලෙස නම් කර 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති පළාත් සභා, විමධ්‍යගත, 3/84 ආදායම් ශිර්ෂය හා ඊට අදාල වියදම් ශිර්ෂය වන 309 (2) වැය ශීර්ෂය පාදක කොට ගෙන ආදායම් වියදම් සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව මෙම යෝජනාවේ කොටසක් වශයෙන් සැලකිය යුතු බවත්, එය 2018 වර්ෂය සඳහා වූ 3 වන පරිපූරක ආදායම් වියදම් ඇස්තමේන්තුව වශයෙන් පිළිගත යුතු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

උපලේඛනය

| අනු අංකය | ලිපි ගොනු අංකය | ව්‍යාපෘති නාමය | ලැබීම් (රු.) | අනු අංකය | ව්‍යාපෘති නාමය | ගෙවීම් (රු.) |
|---|---|---|---|---|---|---|
| 1 | සීප්‍රාස3/2/පස/2018/26 | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාසයේ මිරිස්වත්ත, ඇස්වත්ත පොදු මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම | 4,000,000.00 | 1 | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාසයේ මිරිස්වත්ත, ඇස්වත්ත පොදු මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම | 4,000,000.00 |
| 2 | සීප්‍රාස3/2/පස/2018/27 | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාසයේ රත්දොළුගම පොදු මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම | 4,000,000.00 | 2 | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාසයේ රත්දොළුගම පොදු මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම | 4,000,000.00 |
| 3 | සී.ප්‍රා.ස3/2/පසවි/2018/06 | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාශයේ පහත්ගම අල්විස් වත්ත පොදු පාර සංවර්ධනය කිරීම | 175,000.00 | 3 | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාශයේ පහත්ගම අල්විස් වත්ත පොදු පාර සංවර්ධනය කිරීම | 175,000.00 |
| 4 | සී.ප්‍රා.ස/3/2/ග්‍රාමා1000/2018/71 | තුන්නාන කුඩළුවිල මාර්ගයේ පැති බැම්ම හා බෝක්කුව සංවර්ධනය කිරීම | 2,654,872.29 | 4 | තුන්නාන කුඩළුවිල මාර්ගයේ පැති බැම්ම හා බෝක්කුව සංවර්ධනය කිරීම | 2,654,872.29 |
| 5 | සී.ප්‍රා.ස3/2/ග්‍රාමා1000/2018/72 | තුන්නාන ජයවීරගොඩ දෙසට මාර්ගය කාපට් කිරීමේ අමතර වැඩ (කාණු හා බෝක්කු තැනීම) | 858,937.72 | 5 | තුන්නාන ජයවීරගොඩ දෙසට මාර්ගය කාපට් කිරීමේ අමතර වැඩ (කාණු හා බෝක්කු තැනීම) | 858,937.72 |
| 6 | සී.ප්‍රා.ස3/2/ග්‍රාමා1000/2018/73 | කහහේන පුස්තකාලය සතිපොල පිටුපස ආරක්ෂිත මායිම් තාප්පය ඉදි කිරීම | 1,620,708.28 | 6 | කහහේන පුස්තකාලය සතිපොල පිටුපස ආරක්ෂිත මායිම් තාප්පය ඉදි කිරීම | 1,620,708.28 |
| 7 | සී.ප්‍රා.ස3/2/ග්‍රාමා1000/2018/74 | කහහේන වතුර ටැංකිය පාර දමා සංවර්ධනය කිරීම | 1,106,739.26 | 7 | කහහේන වතුර ටැංකිය පාර දමා සංවර්ධනය කිරීම | 1,106,739.26 |
| එකතුව | | | 14,416,257.55 | එකතුව | | 14,416,257.55 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු සභාපතිතුමා</u>

**මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ඉදිරිපත් කරනවාද. මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.**

**<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.</u>**

**<u>05 – (07) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

**සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපිව ඇති කොන්ත්‍රාත් සමිති/ ආයතන/ පුද්ගලයින් සමඟ ඊට ඉදිරියේ දක්වා ඇති ගිවිසුම් ගත මුදල අනුව ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

| අනු අංක | ව්‍යාපෘතිය | මූල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය/ ආයතනය/ පුද්ගලයා | ගිවිසුම්ගත මුදල රු. |
|---|---|---|---|---|
| 01 | සභාව සතු ZA – 5041 දරණ බැකෝ යන්ත්‍රයේ පැය 3250 න් කළ යුතු සේවා වාරය සඳහා වන ඇස්තමේන්තුව | සභා අරමුදල් | ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ්, අංක 33, 15 බී මහල, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, උද්‍යාන මාවත, කොළඹ 02. | 30,314.17 |
| 02 | සභාව සතු ZA – 5421 දරණ මෝටර් ග්‍රේඩරයේ වයර් හානස් අළුත්වැඩියාව සඳහා වන ඇස්තමේන්තුව | සභා අරමුදල් | වෝකර්ස් ඉක්විප්මන්ට් ලිමිටඩ්, නො.18, මයිකල් පාර, කොළඹ 03. | 20,642.50 |
| 03 | සභාව සතු LE – 6946 දරණ ටිපර් රථයේ අළුත්වැඩියා කටයුතු සඳහා වන ඇස්තමේන්තුව | සභා අරමුදල් | අබේසිංහ ෆ්ලීට් මැනේජ්මන්ට් සර්විසස් (පුද්.) සමාගම, 22/බී. පහත්ගම, හංවැල්ල. | 71,514.20 |
| 04 | සභාව සතු ZA – 5421 දරණ මෝටර් ග්‍රේඩරයේ හයිඩ්‍රොලික් පද්ධතිය අළුත්වැඩියාව සඳහා වන ඇස්තමේන්තුව | සභා අරමුදල් | වෝකර්ස් ඉක්විප්මන්ට් ලිමිටඩ්, නො.18, මයිකල් පාර, කොළඹ 03. | 197,593.00 |
| 05 | සභාව සතු PE – 6879 දරණ කැබ් රථයේ නඩත්තු කටයුතු සිදු කිරිම සඳහා වන ඇස්තමේන්තුව | සභා අරමුදල් | ටොයොටා ලංකා ( පුද්) සමාගම, නො. 391/10, හයිලෙවල් පාර, නාවින්න, මහරගම. | 171,188.71 |
| 06 | බස්නාහිර පළාතේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය සහ වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම පිළිබඳව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියළුම පෙර පාසල් වල ගුරුවරියන් දැනුවත්කිරිමේ වැඩසටහන සඳහා වන ඇස්තමේන්තුව | සභා අරමුදල් | සරප්, ප්‍රධාන කාර්යාලය. | 36,125.00 |
| 07 | තුන්නාන කුඩළුවිල මාර්ගයේ පැති බැම්ම හා බෝක්කුව සංවර්ධනය කිරිම | ග්‍රාමීය මාර්ග 1000 km වැඩසටහන | සභාපති, මෛත්‍රී වැඩිහිටි සමිතිය, කුඩළුවිල. | 2,654,872.29 |
| 08 | තුන්නාන සිට ජයවීරගොඩ දෙසට මාර්ගය කාපට් කිරිමේ අමතර වැඩ ( කාණු සහ බෝක්කු තැනීම) | ග්‍රාමීය මාර්ග 1000 km වැඩසටහන | සභාපති, මෛත්‍රී වැඩිහිටි සමිතිය, කුඩළුවිල. | 858,937.72 |
| 09 | කහහේන පුස්තකාලය සහ සතිපොළ පිටුපස ආරක්ෂිත මායිම් තාප්පය ඉදිකිරිම. | ග්‍රාමීය මාර්ග 1000 km වැඩසටහන | සභාපති, ග්‍රාම සංවර්ධන සමිතිය, කහහේන, වග. | 1,620,708.28 |
| 10 | කහහේන වතුර ටැංකිය පාර තාර දමා සංවර්ධනය කිරිම. | ග්‍රාමීය මාර්ග 1000 km වැඩසටහන | සභාපති, සමගි ගොවි සංවිධානය, කහහේන, වග. | 1,106,739.25 |
| 11 | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ පහත්ගම අල්විස්වත්ත පොදු පාර සංවර්ධනය කිරිම. | පළාත් සංවර්ධන ( විශේෂ) | සභාපති, 443/ඒ පහත්ගම ග්‍රාම සංවර්ධන සමිතිය, | 175,000.00 |
| 12 | බ්‍රැන්ඩිගම්පල ලේන්තැරිය පාර අඩි 300 ක් ගල් අතුරා තාර දැමීම. | සුබිත පුරවර වැඩසටහන | සභාපති, බ්‍රැන්ඩිගම්පල වැඩිහිටි සමිතිය, 248, ලබුගම පාර. | 291,260.26 |
| 13 | ජයවීරගොඩ ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති අතුරු මාර්ගය මීටර 250 ක් තාර දමා සංවර්ධනය කිරිම. | සුබිත පුරවර වැඩසටහන | සභාපති, ශ්‍රී නා සෙවණ වැඩිහිටි සංවිධානය, ජයවීරගොඩ. | 337,276.68 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ඉදිරිපත් කරනවාද. මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

ගරු සභාපතිතුමා

**05 - (08)** යෝජනාව සභාවට ඉදිරිපත් කිරිමට ප්‍රථමයෙන් එම උප ලේඛනයේ සංශෝධන කිහිපයක් තියෙන බව සඳහන් කරනවා.

**109(2)** ලී බඩු හා කාර්යාල උපකරණ වැය ශීර්ෂය සඳහා තවදුරටත් වෙන් කළ යුතු ප්‍රතිපාදන මුදල වන රු. **505,000.00** ක මුදල **550,000.00** ලෙස සංශෝධනය විය යුතුයි.

**509(2)** ලී බඩු හා කාර්යාල උපකරණ වැය ශීර්ෂය අළුතින් මේ යෝජනාවට එකතු වන අතර ඒ සඳහා තවදුරටත් වෙන් කළ යුතු මුදල රු. **450,000.00** ක් වන අතර එය **505(8)** නැණසල වැය ශිර්ෂයෙන් ලබා ගැනේ.

**609(2)** පුස්තකාල හා වෙනත් උපකරණ වැය ශීර්ෂය සඳහා තවදුරටත් වෙන් කළ යුතු මුදල වන රු. **45,000** ක මුදල රු. **70,000.00** ක් ලෙස සංශෝධනය විය යුතුයි. එම රු.**70.000** ක මුදල **109(1)** මෝටර් රථ මිලදී ගැනිමේ වැය ශිර්ෂයෙන් ලබා ගැනේ.

05 – (08) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

**2018** අයවැය ලේඛනයට අනුව පහත උපලේඛනයේ සඳහන් වැය ශීර්ෂයන්හි ප්‍රතිපාදන ඉදිරියට ප්‍රමාණවත් නොවන බැවින් මෙම වර්ෂයේ තවදුරටත් ඉටු කළ යුතු කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එම උප ලේඛනයේ ඊට ඉදිරියෙන් දක්වා ඇති වැය ශීර්ෂයෙන් මාරු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| ප්‍රතිපාදන අවශ්‍ය වැය ශීර්ෂය | 2018 වර්ෂයට වෙන් කර තිබූ ප්‍රතිපාදන මුදල රු. | තවදුරටත් වෙන් කළ යුතු ප්‍රතිපාදන මුදල රු. | ප්‍රතිපාදන ලබා ගන්නා වැය ශීර්ෂය | ලබා ගන්නා ප්‍රතිපාදන මුදල රු. | ප්‍රතිපාදන ලබා ගන්නා වැය ශීර්ෂයේ තවදුරටත් ඉතිරි වන මුදල රු. |
|---|---|---|---|---|---|
| **101(2)** අතිකාල හා නිවාඩු දින වැටුප් | **2,700,000.00** | **350,000.00** | **102(2)** විදේශ ගමන් වියදම්<br>**101(9)1** වෙනත් දීමනා | **300,000.00**<br>**50,000.00** | **-**<br>**258,825.75** |
| **105(3)1** විදුලිය | **444,000.00** | **28,000.00** | **105(3)2** ජලය | **28,000.00** | **115,281.04** |
| **105(5)** වැට් | **2,000,000.00** | **410,000.00** | **101(9)1** වෙනත් දීමනා<br>**107(2)** සුභසාධක ගෙවීම් **504(9)** සුසාන භූමි /ක්‍රීඩා භූමි නඩත්තු | **100,000.00**<br>**100,000.00**<br>**210,000.00** | **158,825.75**<br>**-**<br>**474,600.00** |
| **109(2)** ලී බඩු හා කාර්යාල උපකරණ | **4,260,000.00** | **550,000.00** | **509(1)** ගොඩනැගිලි වාහන හා ඉඩම් මිලදී ගැනීම | **550,000.00** | **-** |
| **201(2)** අතිකාල හා නිවාඩු දින වැටුප් | **2,025,000.00** | **155,000.00** | **301(6)** ජීවන වියදම් දීමනා | **155,000.00** | **3,560,617.96** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 203(8) වෙනත් ගබඩා භාණ්ඩ | 600,000.00 | 155,000.00 | 103(6) සංග්‍රහ | 155,000.00 | 402,666.00 |
| 301(2) අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,800,000.00 | 141,000.00 | 301(6) ජීවන වියදම් දීමනා | 141,000.00 | 3,419,617.96 |
| 303(8) වෙනත් ගබඩා භාණ්ඩ | 75,000.00 | 60,000.00 | 101(9)4 මන්ත්‍රී කමිටු දීමනා | 60,000.00 | 56,500.00 |
| 501(9) වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය | 1,681,000.00 | 111,500.00 | 504(9) සුසාන භූමි /ක්‍රීඩා භූමි නඩත්තු | 111,500.00 | 363,100.00 |
| 509(2) ලී බඩු හා කාර්යාල උපකරණ | 500,000.00 | 450,000.00 | 505(7) නැණසල ව්‍යාපෘතිය | 450,000.00 | 50,000.00 |
| 605(3)1 විදුලිය | 547,000.00 | 60,000.00 | 505(3)1 විදුලිය | 60,000.00 | 238,116.66 |
| 609(2) පුස්තකාල හා වෙනත් උපකරණ | 990,000.00 | 70,000.00 | 109(1) මෝටර් රථ මිලදී ගැනීම | 70,000.00 | 330,000.00 |
| 609(3) ළදරු පාසල් උපකරණ | 400,000.00 | 135,000.00 | 607(9)4 ආගමික /සංස්කෘතික/අධ්‍යාපනික/ප්‍රජාමණ්ඩල / වැඩිහිටි ආදි | 135,000.00 | 553,620.00 |
| 209(1) ගොඩනැගිලි වාහන හා ඉඩම් මිලදී ගැනීම) | 4,000,000.00 | 590000.00 | 305(9)2 ප්‍රිමික්ස් ව්‍යාපෘතිය | 590,000.00 | 3,786,584.00 |
| 304(4) මංමාවත්,පාලම්, බෝක්කු අළුත්වැඩියාව | 34,121,000.00 | 1349875.00 | 305(9)2 ප්‍රිමික්ස් ව්‍යාපෘතිය | 1,349,875.00 | 2,436,709.00 |
| | | <u>4,615,375.00</u> | | <u>4,615,375.00</u> | |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මේ සම්බන්ධයෙන් පහත නම් සදහන් ගරු මන්ත්‍රීතුමා විසින් අදහස් දක්වන ලදී.

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා.

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.

<u>ගරු සභාපතිතුමා</u>

කාරක සභාවක් බවට පත් කරන්න මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා</u>

මෙම මහා සභාව කාරක සභාවක් ලෙසට පත් කළ යුතු යැයි යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනිල් රණසිංහ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු සභාපතිතුමා</u>

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා තවත් අදහස් ඉදිරිපත් කරනවාද. මෙම යෝජනාවත් ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>

<u>ගරු සභාපතිතුමා</u>

මීළගට තියෙන්නේ 05 (09) යෝජනාව. එය පැය 1 ½ අපි කාලය වෙන් කරන ලද යෝජනාවක්. එය ගේන්නේ ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මන්ත්‍රීතුමා. ඒ අනුව ආණ්ඩු පක්ෂය විදිහට අපිට විනාඩි 50 ක් ඒවගේම විපක්ෂය විදිහට විනාඩි 40 ක කාල සීමාවක් වෙන් වෙනවා. ඒ අනුව ඥාණ ප්‍රකාසම් මන්ත්‍රීතුමාට යෝජනාව ඉදිරිපත් කරන්න පුළුවන්. විපක්ෂයෙන් කාලය වෙන් කරන ආකාරය ලැබිලා තියෙනවා. අවශ්‍ය නම් ප්‍රකාශයට පත් කරන්නම්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, අපිට ප්‍රශ්නයක් තියෙනවා කාලය වෙන් කිරිමේදී ප්‍රදිප් මන්ත්‍රීතුමා ආණ්ඩු පක්ෂයේද. විපක්ෂයේද.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ ප්‍රදිප් කුමාර් මැතිතුමා</u>

මම ආණ්ඩු පක්ෂයෙත් නෙමෙයි. විපක්ෂයෙත් නෙමෙයි. අපිට වෙනම ස්ථාවරයක් තියෙනවා. අපි සමහර කාරණා වලදී ආණ්ඩු පක්ෂයත් එක්ක ඉන්නවා. සමහර කාරණා වලදී විපක්ෂයත් එක්ක ඉන්නවා. මේක සීල් ගහලාම යන්න ඕන නැහැ මම ආණ්ඩු පක්ෂයෙද විපක්ෂයෙද කියලා. අපි සමහර කාරණා වලදී ආණ්ඩු පක්ෂය එක්ක එකගයි. සමහර කාරණා වලදී එකග නැහැ. එහෙනම් ඡන්ද විමසීමකට යන්න ඕන නැහැනේ 23 ක් ආණ්ඩු පක්ෂයට ඉන්නවා කියලා යන්න පුළුවන්. අනෙක් අය විපක්ෂය විදිහට යන්න පුළුවන්.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා, කාරක සභාවක් බවට පත් කරලා ඔබතුමාගේ ප්‍රකාශය කරමු. එහෙම නැත්නම් අපි ඒක කණ්ඩායම් රැස්වීමේදි සාකච්ඡා කරමු. අළුත් අවුරුද්දේ අළුත් විදිහට එතුමාට වේලාව වෙන් කරන්න ඕන කොයි විදිහටද කියලා තීරණය කරමු. එතුමාට වේලාව වෙන් කරන්නේ ආණ්ඩු පක්ෂයෙන්ද විපක්ෂයෙන්ද කියලා තීරණය කරමු. මේකේ විපක්ෂයෙන් වේලාව වෙන් කරලා තියෙනවා චන්ද්‍රකුමාර් මන්ත්‍රීතුමාට විනාඩි 10 ක්, මංජුල මන්ත්‍රීතුමාට විනාඩි 05 ක්, සුසන්ත මන්ත්‍රීතුමාට විනාඩි 05 ක්, උපුල් ජිනේන්ද්‍ර මන්ත්‍රීතුමාට විනාඩි 05 ක්, කුමුදිනි ජයවර්ධන මන්ත්‍රීතුමියට විනාඩි 02 ක්, ප්‍රදිප් මන්ත්‍රීතුමාට විනාඩි 03 ක් වෙන් කරලා තියෙනවා. ජනතා විමුක්ති පෙරමුණට විනාඩි 10 ක් වෙන් කරලා තියෙනවා. ඒ අනුව තමයි විපක්ෂයේ කණ්ඩායමට වේලාව වෙන් වෙලා තියෙන්නේ. ඥාණ ප්‍රකාසම් මන්ත්‍රීතුමාට පුළුවන් එතුමාගේ යෝජනාව සභාවට ඉදිරිපත් කරලා අදහස් ඉදිරිපත් කරන්න.

<u>05 – (09) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රු. 500 කි. එයට දීමනාව සමඟ ගෙවනු ලබන්නේ රු.730 කි. අද අප රටට වැඩි ආදායමක් හා ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දෙන මෙම කම්කරුවන් ඔවුන්ගේ දෛනික වැටුප රු.1000 ක් ලබා දෙන මෙන් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

මෙහි පිටපත් අතිගරු ජනාධිපතිතුමාටත්, අතිගරු අග්‍රාමාත්‍යතුමාටත්, කම්කරු අමාත්‍යතුමාටත් යවන ලෙස ඉල්ලා සිටිමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පිරිස් මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මේ සම්බන්ධයෙන් පහත නම් සදහන් ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ ප්‍රේමරත්න මැතිතුමා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනිල් රණසිංහ මැතිතුමා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමුදිනි ජයවර්ධන මැතිතුමිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ ප්‍රදීප් කුමාර් මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ජිනේන්ද්‍ර මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා
17. ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා
18. ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා

<u>ගරු සභාපතිතුමා</u>

මේ යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නැහැ. ඒ නිසා මේ යෝජනාවත් ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

<u>ඉහත යෝජනාව ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>

<u>ගරු සභාපතිතුමා</u>

න්‍යායපත්‍රයට අනුව යෝජනා අවසන්. ඒවාගේම හදිසි යෝජනාවක් මා ඉදිරිපත් කරනවා ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධව.

<u>05 – (10) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපිව ඇති කොන්ත්‍රාත් සමිති/ ආයතන/ පුද්ගලයින් සමඟ ඊට ඉදිරියේ දක්වා ඇති ගිවිසුම් ගත මුදල අනුව ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංක | ව්‍යාපෘතිය | මූල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය/ ආයතනය/ පුද්ගලයා | ගිවිසුම්ගත මුදල රු. |
|---|---|---|---|---|
| 01 | පාදුක්ක ජයන්ති මාවත කොටසක් සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති<br>ග්‍රාම සංවර්ධන සමිතිය,<br>461, පාදුක්ක. | 246,352.81 |
| 02 | සුමේධ විද්‍යාලය අසලින් පරණගම දක්වා මාර්ගයේ පාලම අසල කොටස සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති<br>තාවල්ගොඩ ගොවි<br>සංවිධානය, | 221,650.40 |

| | | | | |
|---|---|---|---|---|
| | | | මැද තාවල්ගොඩ, කොස්ගම. | |
| 03 | මිරිස්වත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති, ඇස්වත්ත එක්සත් සුභසාධක සමිතිය. | 245,274.64 |
| 04 | පරණගම ඉහළ කොස්ගම උතුර ප්‍රජා ශාලාවේ 10.0’ x 8.0 කාමරයක් අළුත්වැඩියා කිරීම. | සභා අරමුදල් | සභාපති පහළ කොස්ගම ග්‍රාම සංවර්ධන සමිතිය, පහළ කොස්ගම, කොස්ගම. | 162,450.00 |
| 05 | මිරිස්වත්ත බෝධිය පාර සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති මිරිස්වත්ත ගොවි සංවිධානය, 428 සී, මිරිස්වත්ත, අළුත්අම්බලම. | 391,046.64 |
| 06 | පින්නවල අලුබෝගහලන්ද පාර කොටසක් අළුත්වැඩියා කිරීම. | සභා අරමුදල් | සභාපති පින්නවල දකුණ ගොවි සංවිධානය, පින්නවල. | 247,373.36 |
| 07 | අංගමුව මාර්ගයේ මීරියගල්ල පාර අසල බෝක්කුව පුළුල් කිරීම. | සභා අරමුදල් | සභාපති වේරගල ගොවි සංවිධානය, | 147,882.86 |
| 08 | වග ජනඋද්‍යාන ගම්මාන පාර කොටසක් සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය, වග බටහිර. | 249,222.70 |
| 09 | යටවතුර කහවල මාර්ගයේ කොටසක් අළුත්වැඩියා කිරීම. | සභා අරමුදල් | සභාපති ග්‍රාම සංවර්ධන සමිතිය, කහවල. | 248,479.16 |
| 10 | රන්මුදු ඇල්ලට ප්‍රවේශ වන පඤ්ඤාගුල මාර්ගය සංවර්ධනය කිරීම. | පළාත් සංවර්ධන ප්‍රදාන | සභාපති වගවත්ත මුත්තුමාරි අම්මාන් දේවස්ථාන සමිතිය. | 1,991,991.57 |
| 11 | ළමා ග්‍රාමය පාරේ බුංවලවත්ත හන්දියේ කහටගහවත්ත කන්ද පාර සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති ලෙව්කේ ගොවි සංවිධානය, නිරිපොල. | 249,997.91 |
| 12 | කළුඅග්ගල ඇගල පාරේ ජලය බැසයන පයිප්ප මාර්ගය සකස් කිරීම. | සභා අරමුදල් | සභාපති කැළණි නදී වැඩිහිටි සමිතිය, කහටපිටිය. | 165,651.32 |
| 13 | සකුණ පියස බහුකාර්ය ගොඩනැගිල්ල වටා තාවකාලික වහලයක් ගැසීම. | සභා අරමුදල් | සභාපති, තාවල්ගොඩ ගොවි සංවිධානය, මැද තාවල්ගොඩ, කොස්ගම. | 326,447.85 |
| 14 | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාශයේ කඩුගොඩ දකුණ ෂෙල්ටන් ගොඩමුණේ මහතාගේ නිවස අසල රජයේ ඉඩමේ පිහිටි පොදු ළිඳ සංවර්ධනය කිරීම. | පළාත් උපමාන පාදක | සභාපති කඩුගොඩ උතුර ග්‍රාම සංවර්ධන සමිතිය. | 160,058.38 |
| 15 | හල්ගස්දෙණිය පාර සංවර්ධනය කිරීම | සභා අරමුදල් | රන්දිරි වැඩිහිටි සමිතිය හිඟුරල, පුවක්පිටිය. | 987,253.47 |
| 16 | කොස්ගම තැපැල් කාර්යාලය අසල මාර්ගය සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති, කැලණි මිටියාවත,427,පහළ කොස්ගම නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය. | 178,976.13 |
| 17 | බෝපේ සියඹලාව පාර කැඩී ඇති රැඳවුම් බැම් කොටස ඉදිකිරීම. අතිරේක ඇස්තමේන්තුව | සභා අරමුදල් | සභාපති සියඹලාපේ ගොවි සංවිධානය. | 370,212.42 |

| | | | | |
|---|---|---|---|---|
| **18** | උග්ගල්ල ගනේලන්ද මාවත සංවර්ධනය කිරීම | සභා අරමුදල් | සභාපති,<br>උග්ගල්ල ජනශක්ති ගොවි සංවිධානය. | **421,853.53** |
| **19** | සීතාවක ප්‍ර.ලේ. කොට්ඨාසයේ ඇස්වත්ත පොදු පළමු පටුමඟ සංවර්ධනය කිරීම **(2018.11.12** දින මහ සභාවේ **05(11) - 15** තීරණයේ සමිතිය සංශෝධනය කිරීම) | පළාත් සංවර්ධන | සභාපති,<br>ඇස්වත්ත එක්සත් සුභ සාධක සමිතිය. | **297,092.45** |
| **20** | මාවල්ගම අරඹ මාර්ගය සංවර්ධනය කිරීම. **(2018.07.10** දින මහ සභාවේ **05(10) -10** තීරණයේ ව්‍යාපෘතිය සංශෝධනය කිරීම) | සභා අරමුදල් | සභාපති,<br>මාවල්ගම වැඩිහිටි සමිතිය. | **252,862.25** |
| **21** | ජයවීරගොඩ සීවලීවත්ත පාර කොටසක් තාර දැමීම. | සභා අරමුදල් | සභාපති,<br>ශ්‍රී නා සෙවණ වැඩිහිටි සංවිධානය **11.** | **493,282.88** |
| **22** | ගලගෙදර කොටුගොඩැල්ල පාර කොටසක් අළුත්වැඩියා කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>ගලගෙදර නැගෙනහිර ගොවි සංවිධානය. | **247,373.36** |
| **23** | සීතාවක ප්‍රා.ලේ. කොට්ඨාසයේ ඇස්වත්ත සීවලි වෙත්තසිංහ පොදු මාර්ගය සංවර්ධනය කිරීම.<br>**(2018.11.12** දින මහ සභාවේ **05 (11) 13** තීරණයේ ගිවිසුම්ගත මුදල සංශෝධනය කිරීම) | පළාත් සංවර්ධන | සභාපති,<br>ඇස්වත්ත එක්සත් සුභ සාධක සමිතිය. | **444,110.03** |
| **24** | සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොස්ගම ප්‍රිමා පොදු මාර්ගය සංවර්ධනය කිරීම.<br>**(2018.11.12** දින මහ සභාවේ **05 (11) 09** තීරණයේ ගිවිසුම්ගත සමිතිය සංශෝධනය කිරීම) | පළාත් සංවර්ධන | සභාපති,<br>මිරිස්වත්ත ගොවි සංවිධානය,<br>මිරිස්වත්ත. | **434,755.49** |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු සභාපතිතුමා</u>

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ඉදිරිපත් කරනවාද. මෙම යෝජනාවත් ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>

**06.**කාරක සභා වාර්තා.

**06 – (01 ) 2018.11.23** පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේ වාර්තාව.

<u>**2018.11.23** වන දින පවත්වන ලද පරිසර හා පහසුකම් කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>

**06 – (02 ) 2018.11.23** කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.

<u>**2018.11.23** වන දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>

**06 – (03 ) 2018.11.26** නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේ වාර්තාව.

<u>**2018.11.26** වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>

**06 - (04) 2018.11.27** **මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේ වාර්තාව.**

<u>ගරු සභාපතිතුමා</u>

**2018.11.27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාවේ සංශෝධන 03 ක් මා විසින් ඉදිරිපත් කරනු ලබනවා.**

**02 (ආ) මුදල් හා ප්‍රතිපත්ති සැකසිමේ කාරක සභාව විසින් කරනු ලබන ගෙවීම් සලකා බැලීම යටතේ**

**තීරණ අංක 12 හි සදහන් රු. 318,338.04 ක මුදල රු. 31,838.04 ලෙසත්,**

**තීරණ අංක 41 හි සදහන් රු. 39,400.00 ක මුදල රු. 394,000.00 ලෙසත් හා**

**තීරණ අංක 117 හි සදහන් රු. 5,900.00 ක මුදල රු. 55,900.00 ලෙසත් සංශෝධනය විය යුතුයි.**

<u>**2018.11.27** වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ නිර්දේශ වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව මහ සභාව විසින් සලකා බලන ලදි.</u>

**06 - (05) 2018.11.12** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

<u>**2018.11.12** වන දින පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදි.</u>

**06 - (06) 2018.11.27** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

<u>**2018.11.27** වන දින පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදි.</u>

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.**

**07 – (01) 2018** **ඔක්තෝම්බර් මාසය ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මා ළග මේ ප්‍රකාශ මාස 10 ම ලැබුණු ඒවා තියෙනවා. මෙකේ සැප්තැම්බර් මාසේ ගත්තාම ආධාර ආදායම් හත්වෙනි ආදායම් ශීර්ෂය හය මිලියන පන්සිය දහහතරදාහස් අසූ තුනයි. ඔක්තෝම්බර් මාසේ ආදායම් ආධාර හය මිලියන පන්සිය දහ හතරදාහස් අසූ තුනයි. ඒ මාස දෙකටම සමානවම ආවාද කියලා තමයි මට දැන ගන්න ඕන.

<u>ගරු සභාපතිතුමා</u>

සැප්තැම්බර් මාසේ හා ඔක්තෝම්බර් මාසයේ ආදායම් ආධාර එක සමානයි කියලාද. මේකේ වැටුප් ඇත්තේ. අපි නිවැරදිවම මේක මුදල් කාරක සභාවේදී ඔබතුමාට කියන්නම්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. එදා මම අයවැය කථාවේ මම මේ තොරතුරු ටික එකතු කළාම තමයි මේ මේ එකතුව අරගත්තාම ඔක්තෝම්බර් වෙනකම් ආදායම ගන්න පුළුවන් මේ ප්‍රාදේශිය සභාවේ. මම එහෙම අරගෙන ඔබතුමාට කිව්වා වරිපනම් 59 % යි එකතු වෙලා තියෙන්නේ කියලා. ඔබතුමා කිව්වා නැහැ 61% ක් කියලා. මම එක වචනයක්වත් අයවැයේ කියපු ඒවා බොරු නැහැ. නමුත් සභාපතිතුමා කිව්වා සමහර දේවල් මංජුල කිව්වේ බොරු කියලා. එහෙම කියන්න එපා. මගේ කථාව අරගෙන වරදක් තියෙනවා නම් බොරු කියලා තියෙනවා නම් මම ඒ සියළු දේවල් වලට බොරු නෙමෙයි කියලා කියන්න මම තර්කානුකූලව කිව්වේ. මගේ අතින් එක වරදක් වෙලා ඇති. ඒ වරද තමයි ගයාන් මන්ත්‍රීතුමා ගෙනාවායි කියපු ඒක මිලියන 1000 ක් විතර කියලා කිව්වා. ඒක මිලියන 100 ක් විතර

වෙන්න ඕන. එතන තමයි වරද වෙලා තියෙන්නේ. අනෙක් එක වචනයක්වත් වැරදි නැහැ. වරිපනම් හා බදු කියන ශීර්ෂය වරිපනම් බදු 59 % යි මේ අවුරුද්දට එකතු වෙලා තියෙන්නේ. මේක ලබා ගන්න පුළුවන් ධම්මිකා මිස් ළගට ගියාම. මම ලබා ගත්තාම 59% යි. හැබැයි හිග වරිපනම් බදු හම්බ වෙලා ඇති. මම නැහැ කියන්නේ නැහැ. ඒක මේ 2018 වර්ෂයේ නෙමෙයි. 2017 හිග මේ අවුරුද්දේත් එකතු කරලා ඇති. මම කිව්ව වචනය තමයි 2018 අවුරුද්දේ වරිපනම් බදු එකතු කරලා තියෙන්නේ 59% යි කියන එක. මම වගකීමෙන් කියනවා ඒවගේම මම මේ කියපු එක වචනයක්වත් වැරදි නැහැ කියලාත් මම කියනවා. සම්මාන කථාවත් බොරු නෙමෙයි. ඒකත් ඇත්ත. මම වගකීමෙන් කිව්වේ. මම බොරු කිව්වේ නැහැයි කියන එකත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු සභාපතිතුමා</u>

අපි මේ ගැන ඔබතුමාට මුදල්කාරක සභාවේදී අවශ්‍ය නම් හරියටම ලබා දෙන්නම්. මම මේ ගත්ත වාර්තාව අනුව ඔබතුමා කියන විදිහට අවුරුද්දට අදාල මුදල 59% යි. 61% කියන්නේ අපේ හිග අයවීම්ද ඇතුළත්ව එකතු කරපු එක තමයි අපි ඔබතුමාට ඉදිරිපත් කරලා තියෙන්නේ.

<u>2018 ඔක්තෝම්බර් මස ලැබීම් හා වියදම් පිළිබද ප්‍රකාශය මහා සභාව විසින් සලකා බලන ලදී.</u>

**08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ.**

<u>ගරු සභාපතිතුමා</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ යටතේ නන්ද කුමාරසිංහ මන්ත්‍රිතුමාගේ ප්‍රකාශයක් තියෙනවා. එය ඉදිරිපත් කිරිම සදහා එතුමාට අවස්ථාව ලබලා දෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි නන්ද කුමාරසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, අප ප්‍රාදේශීය සභාවට අයත් කොස්ගම බොල්ලතාව ගමෙහි එහි ප්‍රධාන විහාරස්ථානයට යාබදව රජයට අයත් ඉඩමක් තියෙනවා. ඒ ඉඩම මැදින් වැවක් තියෙනවා. ඒ වැව මැඩිල්ල නමින් තමයි හඳුන්වන්නේ. එහි ජලය රැදී ඇතත් ජලයෙන් කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. විශාල වශයෙන් වල් වැදී ඇති මෙම වැව සංවර්ධනය කරන ලෙසට ප්‍රදේශවාසින් අපෙන් ඉල්ලා සිටිනවා. ඒවගේම තවද වර්තමානයේ ජනතාවගේ සෞඛ්‍ය ප්‍රශ්නයට උචිත පරිදි ඒ වැව් බැම්ම සකස් කරලා ලයිට් කණු සවි කරලා කොන්ක්‍රිට් ගල් සවි කරලා බ්ලොක් ගල් අල්ලලා විදුලි ලාම්පු සවි කරලා දෙන ලෙසට ජනතාව ඉල්ලා සිටිනවා. ඒවගේම ඒ විහාරස්ථානයේ මේ දවස් වල අසූඅටරියන් බුදු පිළිමයක් ඉදිවෙනවා. ඒ නිසාම ඉතාම අලංකාරව මේ වැව සංවර්ධනය කරලා දුන්නොත් ලස්සන වෙනවා. ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මේ සදහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ස්තුතියි.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි යසරු රාජපක්ෂ මැතිතුමා, ඔල්ගා අතුකෝරල මැතිතුමිය, කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා සහ සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය අද දින සභාවට නොපැමිණිම සම්බන්ධයෙන් නිවාඩු අනුමත කරනවා.

මහා සභාවේ වැඩ කටයුතු අපි අවසන් කරන්නට සූදානම් වෙනවා. 2018 වසරේ අපි සියළුදෙනා පත්වෙලා පැවති අවසාන මහා සභා රැස්වීම. අපි මාස 09 ක කාලයක් මේ මහා සභාවේ කටයුතු කළා. ලබන අළුත් අවුරුද්දේ ජනවාරි මාසේ සභාවත් සමග අපි කටයුතු කරනවා. සමහර විටෙක අපේම කිව හැකි ආණ්ඩුවක් එක්ක අපිට කටයුතු කරන්න පුළුවන් වෙයි කියලාත් අපි විශ්වාස කරනවා. වැඩ කරන්න පුළුවන් ආණ්ඩුවක් එයි. වැඩ කරන ආණ්ඩුවක් අපිත් එක්ක තමයි එන්නේ කියලායි අපි විශ්වාස කරන්නේ. 2015 ජනවාරි 08 න් නතර කර තැනින් පටන් ගන්න පුළුවන් ආණ්ඩුවක්

බිහි වෙයි කියලයි අපේ විශ්වාසය. ඒ ආණ්ඩුවත් සමග එසේ කටයුතු කරන්නට අපි කටයුතු කරනවා. ඒ නිසා අද මේ සභාවේ වගේම දින 10 කින් 15 කින් නත්තල උදා වෙනවා. අපේ සභාවේ සනී හෙක්ටර් පීරිස් මන්ත්‍රීතුමා, සුසන්ත රූපසිංහ මන්ත්‍රීතුමා, මාග්‍රට් මන්ත්‍රීතුමිය, ඔල්ගා අතුකෝරල මන්ත්‍රීතුමිය, අමල් පුස්සැල්ලගේ මන්ත්‍රීතුමා, ෆැන්සිස් මන්ත්‍රීතුමා, අපේ මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා සියළුමදෙනාට අපි සුභ නත්තලයක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා. තව දින කිහිපයකින් ඒ අසිරිමත් නත්තල උදා වෙනවා. ඒවගේම ලබන්නා වූ 2019 වසර අපි සැමදෙනාගේම බලාපාරොත්තු ප්‍රාර්ථනා ඉෂ්ට වෙන වාසනාවන්ත සුභ නව වසරක් වේවා යැයි කියලාත් හැමදෙනාටම ප්‍රාර්ථනා කරනවා.

අද දින සභාවට සහභාගී වුණු ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාටත් ස්තුතියත් ගෞරවයත් මේ අවස්ථාවේ පුද කරනවා. ඒ වගේම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ජනමාධ්‍ය මහත්වරුන්ටත් සියළුදෙනාටම අපේ ගෞරවයත් ස්තුතියත් පුදකරනවා. සහභාගි වු සියළුදෙනාටම ස්තුතිය පුද කරමින් අද දින සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. බොහොම ස්තුතියි.

සභාවේ වැඩ කටයුතු ප.ව. 2.10 ට නිමාවට පත්විය.

කේ.ඒ. චන්දන පද්මසිරි,
ලේකම්,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

2018.12.10 වන දින
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.